# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2231/5 - 2021 ජුනි මස 8 වැනි අඟහරුවාදා - 2021.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමයෙන් -

(අ) ව්‍යාපාර අධ්‍යයන, ව්‍යවහාරික විද්‍යා සහ තාක්ෂණික අධ්‍යයන ශාඛාවන් හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා, 2021 අගෝස්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, විශ්වවිද්‍යාලයක්, පිහිටුවමි ;

(ආ) "වවුනියා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව" යන නාමය සහ අභිධානය එකී විශ්වවිද්‍යාලයට දෙමි ;

(ඇ) එම විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටුවනු ලැබිය යුතු ස්ථානය වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත විය යුතු බවට නියම කරමි ;

(ඈ) තෝරාගත් විෂයයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබාගැනීමේ හැකියාව සහිත මනා පරිචයකින් යුත් අධ්‍යාපනයක් ශිෂ්‍යයන්ට ලබාදීමේ අරමුණ ඇතිව විශ්වවිද්‍යාලය විසින්, පුළුල් පරාසයකින් යුතු විෂයයන්ට සම්බන්ධ පාඨමාලා වැඩිදියුණු කළ යුතු බව නියම කරමි ;

(ඉ) දේශීය සම්පත් පදනම තුළ වටිනාකම් නිර්මාණය කරමින් ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබාදීම පිළිබඳව විශ්වවිද්‍යාලය වැඩි අවධානයක් යොමු කළ යුතු බව නියම කරමි ; සහ

(ඊ) මෙහි උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයේ දක්වා ඇති පීඨ සහ අධ්‍යයන අංශවලින් විශ්වවිද්‍යාලය සමන්විත විය යුතු බව නියම කරමි.

**උපලේඛනය**

| *I වන තීරය* *පීඨ* | *II වන තීරය* *අධ්‍යයන අංශ* |
|---|---|
| ව්‍යාපාර අධ්‍යයන පීඨය | මූල්‍ය හා ගිණුම්කරණ අධ්‍යයන අංශය |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය |
| | ව්‍යාපෘති කළමනාකරණ අධ්‍යයන අංශය |
| | මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය |
| | අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය |
| | ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | කළමනාකරණ සහ ව්‍යවසායකත්ව අධ්‍යයන අංශය |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | භෞතික විද්‍යා අධ්‍යයන අංශය |
| | ජීව විද්‍යා අධ්‍යයන අංශය |
| තාක්ෂණික අධ්‍යයන පීඨය | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය |

මහාචාර්ය **ජී. එල්. පීරිස්**,
අධ්‍යාපන අමාත්‍ය.

2021 ජුනි මස 4 වැනි දින,
කොළඹ දී ය.

06 - 249/1

---

එල්.ඩී.බී. 21/78 (XV) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, එකී පනතේ 22 වන වගන්තිය යටතේ සාදනු ලැබ 1997 මාර්තු මස 26 වැනි දින අංක 968/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ "ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය" පිහිටුවනු ලැබූ නියමය 2021 ජූලි මස 31 වැනි දින සිට බලාත්මක වන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

මහාචාර්ය **ජී. එල්. පීරිස්**,
අධ්‍යාපන අමාත්‍ය.

2021 ජුනි මස 4 වැනි දින,
කොළඹ දී ය.

06 - 249/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.